# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 21 දරන
# මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීම පිළිබඳ පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 මැයි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 65 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 21 දරන මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීම පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 3/81

**මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වූ නීතිය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1922 ඔක්තෝබර් මාසයේ දී බ්‍රසල්ස්හි පවත්වන ලද සමුද්‍ර නීතිය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ දී, නෞභාර පත්‍රවලට අදාළ ඇතැම් රීති ඒකාබද්ධ කිරීම පිණිස සම්මුතියක පදනම ලෙස, කෙටුම්පත් සම්මුතියක් පිළිගන්නා ලෙස තම තමන්ගේ ආණ්ඩු වලට නිර්දේශ කිරීමට එම සම්මේලනයේ නියෝජිතයන් විසින් ඒකමතිකව එකඟ වූ හෙයින් ද:

1923 ඔක්තෝබර් මාසයේදී බ්‍රසල්ස්හි පවත්වන ලද, රැස්වීමක දී, එකී කෙටුම්පත් සම්මුතියෙහි අඩංගු රීති, එකී සම්මේලනය විසින් පත් කරන ලද කමිටුව විසින් සංශෝධනය කරන ලද හෙයින් ද:

නෞභාර පත්‍ර යටතේ ප්‍රවාහකයන්ට අදාළ වන වගකීම්, බැඳීම්, අයිතිවාසිකම් සහ පරිහාර ඇති කිරීමේ අභිප්‍රායෙන්, එසේ සංශෝධනය කරනු ලැබූ පරිදි වූ ද, සුළු වෙනස් කිරීම් සහිතව (85 වන අධිකාරය වූ) මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීම පිළිබඳ ආඥා පනතේ උපලේඛනයෙහි දක්වා තිබෙන්නා වූ ද එකී රීතිවලට නීතිමය බලය ලබා දීමට එම ආඥාපනතින් විධිවිධාන සලස්වා තිබෙන හෙයින් ද:

1968 පෙබරවාරි මාසයේ දී බ්‍රසල්ස්හි පවත්වන ලද සම්මේලනය විසින් එකී රීතිවලට පෙරාතු ලේඛනයක් පිළිගන්නා ලද හෙයින් ද:

එසේ සංශෝධිත පරිදි වූ ද, සුළු වෙනස් කිරීම් සහිතව මේ පනතේ උපලේඛනයෙහි දක්වා තිබෙන්නා වූ ද එකී රීතිවලට නෞභාර පත්‍ර හෝ හිමිකම පිළිබඳ කිසියම් සමාන ලේඛනයක් හෝ යටතේ ප්‍රවාහකයන්ට අදාළ වන වගකීම්, බැඳීම්, අයිතිවාසිකම් සහ පරිහාර ඇති කිරීමේ අභිප්‍රායෙන් නීතිමය බලය දීම, අවශ්‍යානුකූල වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.**

**1.** මේ පනත 1982 අංක 21 දරන මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීම පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයෙහි සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

**අදාළ වන ක්ෂේත්‍රය.**

**2.** (1) මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති රීතිවල විධිවිධානවලට නීතිමය බලය තිබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙහි යම් වරායක සිට ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වෙනත් යම් වරායක් වෙත බඩු ගෙන යන නැව්වල, මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීමට අදාළව සහ එසේ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් එකී විධිවිධාන (1) වන උපවගන්තියට හානිකර නොවන පරිදි බල සහිත විය යුතු අතර, එම විධිවිධානවලට නීතියෙහි ලා බලය තිබිය යුතු ය.

(3) නෞභාර පත්‍රයක් හෝ හිමිකම පිළිබඳ කිසියම් සමාන ලේඛනයක්, නිකුත් කිරීම සඳහා ප්‍රකාශිතව ම හෝ ව්‍යංගයෙන් මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීම සඳහා වූ යම් ගිවිසුමක විධිවිධාන සලස්වා ඇත් නම් මිස, රීතිවල වූ කිසිවක් ගිවිසුමට අදාළ වන්නේ යයි, (4) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත් ව, මේ වගන්තියෙහි කිසිවක් සලකනු නොලැබිය යුතු ය.

(4) රීති අදාළ වන යම් ගිවිසුමක් අඩංගු වන්නා වූ හෝ යම් ගිවිසුමක් පිළිබඳ සාක්ෂිය වන්නා වූ ශ්‍රී ලංකාවෙහි නිකුත් කරන ලද සෑම නෞභාර පත්‍රයක් ම නැතහොත් හිමිකම පිළිබඳ සමාන ලේඛනයක් ම මේ පනත මගින් අදාළ කරන ලද රීතිවල විධිවිධානවලට යටත් ව බලපැවැත්විය යුතු බවට ප්‍රකාශිතව ම සඳහන් ප්‍රකාශයක් එහි අඩංගු විය යුතු ය.

**වෙරළාසන්න වෙළඳාමට අදාළ රීතිවල VI වන ව්‍යවස්ථාව සුළු වශයෙන් වෙනස් කිරීම.**

3. ශ්‍රී ලංකාවෙහි කිසියම් වරායක සිට ශ්‍රී ලංකාවේ වෙනත් යම් වරායක් වෙත බඩු ගෙන යන්නා වූ නැව්වල මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීමට අදාළව, රීතිවල VI වන ව්‍යවස්ථාව විශේෂ බඩු වෙනුවට එකී ව්‍යවස්ථාව ඕනෑම පන්තියක බඩු පිළිබඳව සඳහන් කළාක් මෙන් සහ ඒ ව්‍යවස්ථාවේ දෙවන ඡේදයෙහි අතුරු වගන්තිය ඉවත් කරනු ලැබ ඇත්තාක් මෙන් බලපැවැත්විය යුතු ය.

**රීති අදාළ වන ගිවිසුම් වල දී සමුද්‍ර තරණයට යෝග්‍යතාව පිළිබඳ පරම ප්‍රතිඥාභාරය අනුමිත නොකළ යුතු බව.**

4. රීති අදාළ වන්නා වූ මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීම සඳහා වන යම් ගිවිසුමක දී බඩු ප්‍රවාහක විසින් සමුද්‍ර තරණයට යෝග්‍ය නැවක් සපයන බවට යම් පරම වගකීමක් අනුමිත කරනු නොලැබිය යුතු ය.

**ආරක්ෂා කිරීම් සහ ක්‍රියාවේ යෙදවීම්.**

5. සමුද්‍ර තරණයෙහි යෙදෙන යාත්‍රාවල අයිතිකරුවන්ගේ බැදීම සීමා කෙරෙන තත් කාලයෙහි බලපවත්නා වෙනත් යම් ප්‍රඥප්තියක් ක්‍රියාවේ යෙදවීම කෙරෙහි මේ පනතෙහි කිසිවක් බල නොපෑ යුතු ය.

**85 වන අධිකාරය ඉවත් කිරීම.**

6. මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීම පිළිබඳ ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

**අර්ථ නිරූපණය.**

7. මේ පනතෙහි "රීති" යන්නෙන් මෙහි උපලේඛනයෙහි දක්වා තිබෙන්නා වූ ද, 1968 පෙබරවාරි මස 23 වන දින බ්‍රසල්ස්හි දී අත්සන් තබන ලද පෙරාතු ලේඛනය මගින් සංශෝධිත වූ ද, 1924 අගෝස්තු මස 25 වන දින බ්‍රසල්ස්හි දී අත්සන් තබන ලද, නෞභාර පත්‍රවලට අදාළ නීතියේ ඇතැම් රීති ඒකාබද්ධ කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය අදහස් වේ.

# උපලේඛනය

## 1968 බ්‍රසල්ස් පෙරාතු ලේඛනය මගින් සංශෝධිත හේග් රීති

### I වන ව්‍යවස්ථාව

මේ රීතිවල පහත දැක්වෙන වචන, පහතින් දක්වා ඇති අදහස ඇතිව උපයෝගී කර ගනු ලැබේ:—

(අ) "ප්‍රවාහක" යන්නට නැව්ගත කරන්නකු සමග ප්‍රවාහනය කිරීමේ ගිවිසුමකට එළඹෙන අයිතිකරු හෝ කුලියට ගන්නා අදහස් වේ.

(ආ) "ප්‍රවාහනය කිරීමේ ගිවිසුම" යන්න නෞභාර පත්‍රයක් නැතහොත් හිමිකම පිළිබඳ සමාන ලේඛනයක් මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීමට අදාළ වන්නේ යම් තාක් දුරට ද ඒ තාක්, ඒ ලේඛනය මගින් ආවරණිත ප්‍රවාහනය කිරීමේ ගිවිසුම්වලට පමණක් අදාළ වන අතර, ඒ නෞභාර පත්‍රය නැතහොත් හිමිකම පිළිබඳ සමාන ලේඛනය ප්‍රවාහකයකු සහ එය දරන්නකු අතර සම්බන්ධතාව විධිමත් කරන අවස්ථාවේ සිට, නෞභාටක පත්‍රයක් යටතේ හෝ එය ප්‍රකාර හෝ නිකුත් කරන ලද පෙර කී පරිදි නෞභාර පත්‍රයක් නැතහොත් සමාන ලේඛනයක් ඇතුළත් වේ.

(ඇ) "බඩු" යන්නට, සජීවී සතුන් සහ ප්‍රවාහනය කිරීමේ ගිවිසුම මගින්, නැව් තට්ටුවෙහි ගෙන යනු ලබන්නේ යයි සඳහන් කරනු ලැබ එසේ ගෙන යනු ලබන නැව් බඩු හැර, බඩු, ගුදම් බඩු, වෙළෙඳ බඩු සහ සෑම වර්ගයකම කිනම් හෝ ආකාරයේ භාණ්ඩ ඇතුළත් වේ.

(ඈ) "නැව" යන්නෙන් මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීම සඳහා උපයෝගී කර ගනු ලබන යම් යාත්‍රාවක් අදහස් වේ.

(ඉ) "බඩු ප්‍රවාහනය කිරීම" යන්නට නැවට බඩු පටවනු ලබන වේලාවේ සිට නැවෙන් බඩු බෑමේ වේලාව දක්වා වූ කාලසීමාව ආවරණය වේ.

### II වන ව්‍යවස්ථාව

මුහුදෙන් බඩු ප්‍රවාහනය කිරීමේ සෑම ගිවිසුමක් ම යටතේ, ඒ බඩු පැටවීම, හැසිරවීම, අහුරා තැබීම, ප්‍රවාහනය කිරීම, භාරයෙහි තබා ගැනීම, ආරක්ෂා කිරීම සහ බෑම සම්බන්ධයෙන්, VI වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව, මෙහි පහත දක්වා ඇති වගකීම්වලට සහ බැඳීම්වලට ප්‍රවාහක යටත් විය යුතු අතර එසේ දක්වා ඇති අයිතිවාසිකම්වලට සහ පරිහාරවලට ද ඔහු හිමිකම ලැබිය යුතු ය.

### III වන ව්‍යවස්ථාව

1. ගමන ආරම්භ කිරීමට පෙර සහ ගමන ආරම්භ කරන අවස්ථාවේ දී—

(අ) නැව සමුද්‍ර තරණය සඳහා යෝග්‍ය කිරීම;

(ආ) නැවට නිසි ආකාරව සේවා පිරිස්, උපකරණ සහ සැපයුම් ලබා දීම;

(ඇ) අන්තර් ධාරිත, ශීත කිරීමේ සහ සිසිල් ගබඩා සහ බඩු ප්‍රවාහනය කරනු ලබන නැවේ සෙසු සියලු කොටස්, බඩු භාර ගැනීමට, ප්‍රවාහනය කිරීමට සහ සංරක්ෂණය කිරීමට සුදුසු සහ ආරක්ෂාකාරී තත්ත්වයට පත් කිරීම

පිණිස නිසි උනන්දුවෙන් ක්‍රියා කිරීමට ප්‍රවාහක බැඳී සිටිය යුතු ය.

2. ප්‍රවාහනය කරනු ලබන බඩු, ප්‍රවාහක විසින් IV වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව නිසි ලෙස සහ ආරක්ෂා සහිත ලෙස පැටවීම, හැසිරවීම, අහුරා තැබීම, ගෙන යාම, තැබීම, ආරක්ෂා කිරීම සහ බෑම කරනු ලැබිය යුතු ය.

3. බඩු තම භාරයට ලැබුණු පසුව, ප්‍රවාහක හෝ ප්‍රවාහකගේ නෞකාධිපති හෝ අනුයෝජිතයා හෝ විසින්, නැව්ගත කරන්නා ඉල්ලූ විට, වෙනත් දේ අතර—

(අ) බඩු පැටවීම ආරම්භ කිරීමට පෙර, නැව්ගත කරන්නා විසින් ලියවිල්ලකින් සපයන ලද පරිදි ම වූ ද, ගමනාන්තය දක්වා ම සාමාන්‍යයෙන් කියවිය හැකි ආකාරයට තිබිය යුතු වූ ද අනාවරණිත බඩු නම්, ඒ බඩු මත හෝ බඩු අඩංගු කර ඇති කෝෂ නැතහොත් ආවරණ මත හෝ මුද්‍රා තබන ලද්දා වූ නැතහොත් පැහැදිලි ලෙස දක්වන ලද්දා වූ ද බඩු හඳුනා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රධාන සලකුණු;

(ආ) නැව්ගත කරන්නා විසින් ලියවිල්ලකින් සපයන ලද පරිදි වූ අවස්ථා වෝචිත පරිදි බඩු මිටි හෝ කෑලි සංඛ්‍යාව නැතහොත් ප්‍රමාණය හෝ බර;

(ඇ) බඩුවල දක්නට ඇති පිළිවෙළ සහ තත්ත්වය

දැක්වෙන නෞභාර පත්‍රයක් නැව්ගත කරන්නා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද ඇත්ත වශයෙන් ම භාර ගත්තා ලද බඩු පිළිබඳව නිවැරදි නියෝජනයක් නොවන බවට සැක කිරීමට සාධාරණ හේතු තමාට තිබෙන්නේ හෝ හරි වැරදි බැලීමට සැධාරණ ක්‍රමයක් තමාට නොතිබෙන්නේ හෝ සළකුණු කිසිවක්, සංඛ්‍යාව, ප්‍රමාණය නැතහොත් බර සම්බන්ධයෙන් ද, ඒ සළකුණු, සංඛ්‍යාව, ප්‍රමාණය නැතහොත් බර නෞභාර පත්‍රයෙහි සඳහන් කිරීමට හෝ දැක්වීමට කිසිම ප්‍රවාහකයකු හෝ ප්‍රවාහකයකුගේ නෞකාධිපතියකු නැතහොත් අනුයෝජිතයකු බැඳී නොසිටින්නේ ය.

4. එවැනි නෞභාර පත්‍රයක්, 3(අ), (ආ) සහ (ඇ) ඡේදවලට අනුකූලව, එහි විස්තර කර ඇති බඩු ප්‍රවාහක වෙත ලැබුණ බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂිය විය යුතු ය. එහෙත් සද්භාවයෙන් ක්‍රියා කරන තෘතිය පාර්ශ්වයකට නෞභාර පත්‍රය පවරනු ලැබ ඇති විට මීට පටහැනි සාක්ෂි ආවේශ්‍ය නොවිය යුතු ය.

5. නැව්ගත කරන්නා විසින් සපයන ලද පරිදි වූ සළකුණු, සංඛ්‍යාව, ප්‍රමාණය සහ බර සම්බන්ධයෙන් නැව්ගත කරන අවස්ථාවේ දී නිරවද්‍යතාව පිළිබඳව ඔහු විසින් ප්‍රවාහක වෙත සහතික වී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ විස්තර පිළිබඳ සාවද්‍යතා නිසා උද්ගතවන හෝ ප්‍රතිඵල වශයෙන් ඇතිවන සියලු අලාභ, හානි සහ වියදම් සම්බන්ධයෙන් නැව්ගත කරන්නා විසින් ප්‍රවාහකට හානිපූරණය කළ යුතු ය. ඒ හානිපූරණ සඳහා ප්‍රවාහකගේ අයිතිවාසිකම හේතුකොට ගෙන නැව්ගත කරන්නා නොවන යම් තැනැත්තකුට ප්‍රවාහනය කිරීමේ ගිවිසුම යටතේ ප්‍රවාහකගේ ඇති වගකීම සහ බැඳීම් කිසිදු ආකාරයකින් සීමා නොවිය යුතු ය.

6. අලාභය හෝ හානිය ද ඒ අලාභයේ හෝ හානියේ සාමාන්‍ය ස්වභාවය ද ප්‍රවාහනය කිරීමේ ගිවිසුම යටතේ බඩු භාර ගැනීමට හිමිකම ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ භාරය වෙත බඩු ගෙන යාමට පෙර හෝ ගෙන යනු ලබන අවස්ථාවේ එම බඩු බාන වරායේ දී නැතහොත් අලාභය හෝ හානිය දෘශ්‍යමාන නොවේ නම් දින තුනක් ඇතුළත දී හෝ ප්‍රවාහක හෝ ඔහුගේ අනුයෝජිතයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබුවහොත් මිස, නෞභාර පත්‍රයෙහි විස්තර කර ඇති බඩු ප්‍රවාහක විසින් බාර දුන් බවට ඒ බඩු ගෙන යාම බැලූ බැල්මට පෙනෙන සාක්ෂිය විය යුතු ය.

එම බඩු බාර ගන්නා අවස්ථාවේ දී එම බඩුවල තත්ත්වය, හවුල් සමීක්ෂණයක හෝ පරීක්ෂණයකට භාජනය වී නම්, ලියවිල්ලකින් වූ දැනුම් දීම කිරීම අවශ්‍ය නොවන්නේ ය. බඩු බාර දීමේ අවස්ථාවේ හෝ ඒවා බාර දෙනු ලැබිය යුතු වූ දිනයේ හෝ සිට එක් අවුරුද්දක් ඇතුළත නඩු පවරනු ලැබුවහොත් මිස එම බඩු සම්බන්ධයෙන් කවර වූ හෝ ආකාරයක සියලු බැඳීම්වලින් ප්‍රවාහක සහ නැව, 6 බීඅයිඑස් වන ඡේදයට යටත්ව, නිදහස් කරනු ලැබිය යුතු ය. කෙසේ වුව ද නඩු නිමිත්ත උද්ගත වූ පසුව මෙම කාල සීමාව දීර්ඝ කර ගැනීමට පාර්ශ්වකරුවෝ එකඟ වෙත් නම්, මෙම කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

නියම වශයෙන් සිදු වූ හෝ අපේක්ෂිත යම් අලාභයක දී නැතහොත් හානියක දී ප්‍රවාහක සහ භාර ගන්නා විසින් බඩු පරීක්ෂා කිරීම සහ සැසඳීම පිණිස, එකිනෙකා වෙත සාධාරණ පහසුකම් සලසා දිය යුතුය.

6 බීඅයිඑස්. නඩුව විභාග කරන අධිකරණයේ නීතියෙන් ඉඩ දෙනු ලබන කාලය ඇතුළත ඉදිරිපත් කරනු ලැබුවහොත්. ඉහත සඳහන් ඡේදයෙහි ඉඩ සලසා ඇති අවුරුද්ද ඉකුත් වීමෙන් පසුව වුව ද හානිපූරණය සඳහා තෘතීය පාර්ශ්වයකට විරුද්ධව නඩුවක් පවරනු ලැබිය හැකි ය. කෙසේ වුව ද ඉඩ දෙන ලද කාලය, හානිපූරණය සඳහා නඩුව ඉදිරිපත් කරන තැනැත්තා හිමිකම් පෑම පියවන ලද හෝ තමාට ම විරුද්ධව නඩුවේ අධිකරණ නියෝගය තමා වෙත බාර දෙන ලද හෝ දිනයෙන් ආරම්භව මාස තුනකට අඩු නොවිය යුතු ය.

7. බඩු පැටවීමෙන් පසු නැව්ගත කරන්නා වෙත ප්‍රවාහක, නෞකාධිපති නැතහොත් ප්‍රවාහකගේ අනුයෝජිත විසින් නිකුත් කරනු ලබන නෞභාර පත්‍රය, "නැව්ගත කරන ලද බවට" වූ නෞභාර පත්‍රයක් විය යුතු යයි නැව්ගත කරන්නා ඉල්ලා සිටියහොත් එය නැව්ගත කරන ලද බවට වූ නෞභාර පත්‍රයක් විය යුතු ය. එසේ වුව ද ඒ බඩු සම්බන්ධයෙන් හිමිකම් පිළිබඳ යම් ලේඛනයක් නැව්ගත කරන්නා විසින් කලින් ලබාගෙන ඇත්නම්, "නැව්ගත කරන ලද බවට" වූ නෞභාර පත්‍රය වෙනුවට ඔහු එය ආපසු භාර දිය යුතු ය. එහෙත් ඒ හිමිකම පිළිබඳ ලේඛනය, ප්‍රවාහකගේ මනාපය පරිදි, බඩු නැව්ගත කරනු ලැබ ඇති නැවෙහි නම හෝ නැව්වල නම් ද, නැව්ගත කිරීමේ දිනය හෝ දිනයන් ද සහිතව ප්‍රවාහක, නෞකාධිපති හෝ අනුයෝජිත විසින් නැව්ගත කිරීමේ වරායේ දී සටහන් කරගනු ලැබිය හැකි අතර, එසේ සටහන් කර ගනු ලැබූ විට, එය III වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ සඳහන් කර ඇති විස්තර දක්වයි නම්, මේ ව්‍යවස්ථාවේ කාර්යය සඳහා "නැව්ගත කරන ලද බවට" වූ නෞභාර පත්‍රයක් සංයුක්ත කෙරෙතැයි සලකනු ලැබිය යුතු ය.

8. මේ ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති යුතුකම් සහ බැඳීම් නොසලකා හැරීමෙන්, දෝෂ සහිතව ඉටු කිරීමෙන් හෝ පැහැර හැරීමෙන් බඩුවලට හෝ බඩු සම්බන්ධයෙන් සිදුවන අලාභ හෝ හානි සඳහා වූ බැඳීමෙන් ප්‍රවාහක හෝ නැව නිදහස් කරන්නා වූ හෝ මේ රීතිවල විධිවිධාන සලසා ඇති ආකාරයට නොව අන් ලෙසකින් ඒ බැඳීම අඩු කරන්නා වූ, ප්‍රවාහනය කිරීමේ ගිවිසුමක ඇති යම් වගන්තියක්, ප්‍රතිඥාවක් හෝ එකඟවීමක් ශූන්‍ය සහ බලරහිත විය යුතු අතර, බලාත්මක නොවිය යුතු ය. ප්‍රවාහකගේ වාසියට තිබෙන රක්ෂණයක ප්‍රතිලාභයක් හෝ සමාන වගන්තියක් ප්‍රවාහක බැඳීමෙන් නිදහස් කරන වගන්තියක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## IV වන ව්‍යවස්ථාව

1. III වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ විධිවිධානවලට අනුකූලව නැව සමුද්‍ර තරණය සඳහා යෝග්‍ය බවට පත් කර තිබීමෙහි ලා සහ නැවට නිසි ආකාරව සේවා පිරිස්, උපකරණ සහ සැපයුම් සලසා තිබීමෙහි ලා සහ අන්තර් ධාරිත, ශීත කිරීමේ සහ සිසිල් ගබඩා සහ බඩු ප්‍රවාහනය කරනු ලබන නැවේ සෙසු සියලු කොටස් බඩු බාර ගැනීමට, ප්‍රවාහනය කිරීමට සහ සංරක්ෂණය කිරීමට සුදුසු සහ ආරක්ෂාකාරී තත්ත්වයට පත් කිරීමෙහි ලා, ප්‍රවාහක විසින් නිසි උනන්දුවෙන් ක්‍රියා නොකර තිබීමේ හේතුවෙන් උද්ගත වුවහොත් මිස, සමුද්‍රතරණයට අයෝග්‍ය වීමෙන් උද්ගත වන්නා වූ හෝ එහි ප්‍රතිඵලය වශයෙන් වූ අලාභ නැතහොත් හානි සඳහා ප්‍රවාහක හෝ නැව හෝ වගකිව යුතු නොවන්නේ ය. සමුද්‍ර තරණයට අයෝග්‍ය වීමේ හේතුවෙන් අලාභ හෝ හානි සිදු වූ කිනම් අවස්ථාවක වුව ද නිසි උනන්දුවෙන් ක්‍රියා කළ බවට ඔප්පු කිරීමේ භාරය ප්‍රවාහක හෝ මේ ව්‍යවස්ථාව යටතේ නිදහස් කරන ලෙස ඉල්ලා සිටින වෙනත් තැනැත්තා හෝ වෙත පැවරෙන්නේ ය.

2. (අ) නැව යාත්‍රා කරවීමේ දී හෝ පාලනය කිරීමේ දී නෞකාධිපති, නැවියා, නියමුවා හෝ ප්‍රවාහකගේ සේවකයන් විසින් කරනු ලබන ක්‍රියාවකින්, නොසලකා හැරීමකින් හෝ පැහැර හැරීමකින් ;

(ආ) ප්‍රවාහකගේ නියත දෝෂයක් හෝ සම්බන්ධතාවක් නිසා සිදුවූයේ නම් මිස, ගින්නකින් ;

(ඇ) මුහුදෙහි හෝ යාත්‍රා ගෙන යා හැකි ජලයෙහි උපද්‍රවවලින්, අනතුරුවලින් සහ හදිසි අනතුරුවලින් ;

(ඈ) දේව ක්‍රියාවෙන් ;

(ඉ) යුද්ධ ක්‍රියාවකින් ;

(ඊ) පොදු හතුරන්ගේ ක්‍රියාවකින් ;

(උ) කුමාරවරු, පාලකවරු හෝ ජනතාව අත් අඩංගුවට ගැනීමෙන් හෝ රඳවා ගැනීමෙන් හෝ නීතිමය ක්‍රියා මාර්ගයක් යටතේ තහනමට ගැනීමෙන් ;

(ඌ) නිරෝධායන සීමාකිරීම්වලින් ;

(එ) බඩු නැව්ගත කරන්නාගේ හෝ අයිතිකරුගේ හෝ ඔහුගේ අනුයෝජිතයාගේ හෝ නියෝජිතයාගේ ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් ;

(ඒ) කිනම් හේතුවක් නිසා වුව ද කොටසක් වශයෙන් හෝ පොදු වශයෙන් වැඩ වර්ජනවලින් හෝ පිටලෑම්වලින් හෝ වැඩ නතර කිරීමෙන් හෝ වැඩ කිරීම වැළැක්වීමෙන් ;

(ඔ) කැරලිවලින් සහ මහජන කැළඹීම්වලින් ;

(ඕ) මුහුදේ දී ජීවිත හෝ දේපළ බේරා ගැනීමෙන් හෝ බේරා ගැනීමට තැත් කිරීමෙන් ;

(ක) බඩුවල ආවේණික දෝෂවල, තත්ත්වයේ හෝ ඌනතාවල හේතුවෙන් උද්ගත වන්නා වූ තොගයේ හෝ බරෙහි ක්ෂය වීමකින් හෝ වෙනත් යම් අලාභයකින් හෝ හානියකින් ;

(ග) ඇසිරීමේ අඩුපාඩුවලින් ;

(ච) ලකුණු අඩුපාඩුවලින් හෝ ඒවා අප්‍රමාණවත් වීමෙන් ;

(ජ) නිසි උනන්දුව ඇතිව සොයාගත නොහැකි ප්‍රච්ඡන්න දෝෂවලින් ;

(ට) අලාභය නැතහොත් හානිය ප්‍රවාහකගේ නියත දෝෂයක් හෝ සම්බන්ධතාවක් නොමැතිව හෝ ප්‍රවාහකගේ අනුයෝජිතයන්ගේ හෝ සේවකයන්ගේ දෝෂයක් හෝ නොසලකා හැරීමක් නොමැතිව හෝ සිදු වූ බව ඔප්පු කිරීමේ භාරය මේ ව්‍යතිරේකයේ වාසිය ඉල්ලා සිටින තැනැත්තා වෙත පැවරෙමින් ප්‍රවාහකගේ නියත දෝෂයක් හෝ සම්බන්ධතාවක් නැතිව හෝ ප්‍රවාහකගේ අනුයෝජිතයන්ගේ හෝ සේවකයන්ගේ දෝෂයක් හෝ නොසලකා හැරීමක් නොමැතිව හෝ උද්ගත වන වෙනත් යම් හේතුවකින්

උද්ගත වන හෝ ප්‍රතිඵල වශයෙන් වන අලාභයට හෝ හානියට ප්‍රවාහක හෝ නැව වගකිව යුතු නොවන්නේ ය.

3. නැව්ගත කරන්නාගේ, ඔහුගේ අනුයෝජිතයන්ගේ හෝ ඔහුගේ සේවකයන්ගේ ක්‍රියාවක්, දෝෂයක් හෝ නොසලකා හැරීමක් නොමැති යම් හේතුවකින් උද්ගත වී හෝ ප්‍රතිඵල වශයෙන් ප්‍රවාහකට හෝ නැවට දරන්නට සිදුවන අලාභ හෝ හානි සඳහා නැව්ගත කරන්නා වගකිව යුතු නොවන්නේ ය.

4. මුහුදේ දී ජීවිත හෝ දේපළ බේරා ගැනීම හෝ බේරා ගැනීමට තැත් කිරීම සඳහා වූ යම් අපගමනයක් හෝ යම් සාධාරණ වූ අපගමනයක් මේ රීති හෝ ප්‍රවාහනය කිරීමේ ගිවිසුම හෝ උල්ලංඝනය කිරීමක් නැතහොත් කඩ කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු අතර, එයි ප්‍රතිඵලය වශයෙන් ඇති වන යම් අලාභයක් හෝ හානියක් සඳහා ප්‍රවාහක වගකිව යුතු නොවන්නේ ය.

5. (අ) නැව්ගත කිරීමට පෙර නැව්ගත කරන්නා විසින් බඩුවල ස්වභාවය සහ වටිනාකම ප්‍රකාශ කරනු ලැබ, නෞභාර පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබ ඇත්නම් මිස, නැති වූ හෝ හානි වූ බඩුවල, එක් බඩු මිටියකට හෝ ඒකකයකට ප්‍රෑන්ක් 10,000 ක් හෝ දළ බර කිලෝ එකක් සඳහා ප්‍රෑන්ක් 30 ක් බැගින් හෝ යන දෙකින් වඩාත් වැඩි මුදල් ප්‍රමාණයක් ඉක්මවන බඩුවලට හෝ බඩු සම්බන්ධයෙන් යම් අලාභයකට හෝ හානියකට ප්‍රවාහක හෝ නැව හෝ කිසියම් විටක දී වගකිව යුතු නොවන අතර, මතුවට ද වගකිව යුතු නොවන්නේ ය.

(ආ) අය කරගත යුතු මුළු මුදල් ප්‍රමාණය, ගිවිසුමට අනුව ඒ බඩු නැවෙන් බාන ලද හෝ බානු ලැබිය යුතු හෝ ස්ථානයෙහි සහ වේලාවෙහි ඒ බඩුවල වටිනාකම සැලකිල්ලට ගෙන ගණන් බලනු ලැබිය යුතු ය. බඩුවල වටිනාකම, වෙළෙඳ ද්‍රව්‍ය හුවමාරු මිළ අනුව හෝ එවැනි මිළක් නොමැති නම් පවත්නා වෙළෙඳ මිල අනුව හෝ වෙළෙඳ ද්‍රව්‍ය හුවමාරු මිලක් හෝ පවත්නා වෙළෙඳ මිලක් නොමැති නම් එම වර්ගයේ සහ තත්ත්වයේ බඩුවල සාමාන්‍ය වටිනාකම හෝ සැලකිල්ලට ගෙන තීරණය කරනු ලැබිය යුතු ය.

(ඈ) බඩු ඒකරාශී කිරීමට ධාරකයක්, පලකයක් හෝ ප්‍රවාහනය කිරීමේ සමාන භාණ්ඩයක් ප්‍රයෝජනයට ගනු ලැබ ඇති අවස්ථාවක, ඒ ප්‍රවාහනය කිරීමේ භාණ්ඩයෙහි අසුරා ඇති ලෙස නෞභාර පත්‍රයෙහි සඳහන් කොට ඇති මිටි හෝ ඒකක සංඛ්‍යාව, එම මිටි හෝ ඒකක සම්බන්ධයෙන් අදාළ වන තාක් දුරට මේ ඡේදයේ කාර්යය සඳහා මිටි හෝ ඒකක සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය. ඉහත සඳහන් කර ඇති ආකාරයට හැරුනු විට, ඒ ප්‍රවාහනය කිරීමේ භාණ්ඩය මිටිය හෝ ඒකකය ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) ප්‍රෑන්කුවක් යන්නෙන් මිලේ සිමල් ශුද්ධතාවය 900 කින් යුක්ත රත්තරං මිලි ග්‍රෑම් 65.5 කින් සමන්විත ඒකකයක් අදහස් වේ. ප්‍රදානය කරන ලද මුදල ජාතික ව්‍යවහාර මුදලට පරිවර්තනය කිරීමේ දිනය, නඩුව සම්බන්ධයෙන් ක්‍රියා කරන අධිකරණයේ නීතිය මගින් පාලනය විය යුතු ය.

(ඉ) හානි කිරීමේ චේතනාව ඇතිව හෝ නොසැලකිලිමත් ලෙස සහ හානියක් සිදුවීමට ඉඩ ඇතැයි යන දැනීම ඇතිව ප්‍රවාහකයගේ ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් හානිය සිදු වී ඇති බව ඔප්පු වන්නේ නම්, මේ ඡේදයේ විධිවිධාන සලසා ඇති වගකීම පිළිබඳ සීමා කිරීමෙන් ප්‍රයෝජනය ලබාගැනීමට ප්‍රවාහකයට හෝ නැවට හිමිකම නොතිබිය යුතු ය.

(ඊ) මේ ඡේදයේ (අ) අනු ඡේදයෙහි සඳහන් ප්‍රකාශනය නෞභාර පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබ ඇත් නම්, එය බැලූ බැල්මට පෙනෙන සාක්ෂිය විය යුතු නමුත්, ප්‍රවාහක සම්බන්ධයෙන් එය අනුගම්‍ය හෝ තීරණාත්මක නොවිය යුතු ය.

(උ) ප්‍රවාහක, ප්‍රවාහකයගේ නෞකාධිපති හෝ අනුයෝජිතයා සහ නැව්ගත කරන්නා අතර එකඟවීම මගින්, මේ ඡේදයේ (අ) අනු ඡේදයෙහි සඳහන් උපරිම ප්‍රමාණයන් නොවන උපරිම ප්‍රමාණයන් නියම කරනු ලැබිය හැකි ය. එසේ වුව ද එසේ නියම කරන ලද උපරිම ප්‍රමාණ කිසිවක් එම අනු ඡේදයෙහි සඳහන් උචිත උපරිමයට අඩු නොවිය යුතු ය.

(ඌ) නැව් ගත කරන්නා විසින් බඩුවල ස්වභාවය හෝ වටිනාකම දැනුවත්ව ම නෞභාර පත්‍රයෙහි වැරදි ලෙස ප්‍රකාශකර ඇත් නම් ඒ බඩුවලට හෝ ඒ බඩු සම්බන්ධයෙන් යම් අලාභයක් හෝ හානියක් සඳහා කිසි විටක ප්‍රවාහක හෝ නැව වගකිව යුතු නොවන්නේ ය.

6. ගිනි ගන්නා, පුපුරන හෝ අන්තරාදායක ස්වභාවයේ බඩුවල ස්වභාවය සහ තත්ත්වය ගැන දැනීම ඇතිව ඒ සම්බන්ධයෙන් ප්‍රවාහක විසින් හෝ ප්‍රවාහකයගේ නෞකාධිපති හෝ අනුයෝජිත විසින් හෝ නැව් ගත කිරීමට කැමැත්ත නොදැක්වූවා වූ බඩු බෑමට පෙර ඕනෑම වේලාවක දී ප්‍රවාහක විසින් වන්දියක් නොගෙවා ඕනෑම ස්ථානයක ගොඩ බානු ලැබිය හැකි ය; නැතහොත් විනාශ කිරීම හෝ නිරුපද්‍ර කිරීම කරනු ලැබිය හැකි ය. ඒ නැව් ගත කිරීමෙන් කෙළින් ම හෝ අන්‍යාකාරයෙන් උද්ගත වන්නා වූ නැතහොත් එහි ප්‍රතිඵල වශයෙන් ඇති වන්නා වූ සියලු හානි සහ වියදම් සඳහා ඒ බඩු නැව්ගත කරන්නා වගකිව යුතු ය. ඒ දැනීම සහ කැමැත්ත ඇතිව නැව්ගත කරන ලද එවැනි බඩු කිසිවක් හේතු කොට ගෙන නැවට හෝ නැව් බඩුවලට අනතුරක් සිදු වුවහොත් ඒවාට ප්‍රවාහක විසින් පොදු වන්දි ප්‍රමාණයට වගකිව යුතු නම් ඒ ප්‍රමාණයට හැර ප්‍රවාහකට වගකීමක් නොමැතිව ඒ පරිද්දෙන් ම ඕනෑම ස්ථානයක බඩු ගොඩ බෑම හෝ විනාශ කිරීම හෝ නිරුපද්‍ර බවට පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

## IV වන බිඅයිඑස් ව්‍යවස්ථාව

1. බඩු ප්‍රවාහනය කිරීමේ ගිවිසුමකින් ආවරණීත බඩුවලට සිදුවන්නා වූ අලාභය හෝ හානිය සම්බන්ධයෙන් ප්‍රවාහකට විරුද්ධ යම් නඩුවක් පදනම් වී ඇත්තේ ගිවිසුමක් මත වුව ද සිවිල් වරදක් මත වුව ද මේ රීතිවල විධිවිධාන සලසා ඇති විත්තිවාචක සහ වගකීමේ සීමා ඊට අදාළ විය යුතු ය.

2. එවැනි නඩුවක් (ස්වාධීන ගිවිසුම්කරුවකු නොවන) ප්‍රවාහකගේ සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබුවහොත්, මේ රීති යටතේ ප්‍රවාහකට හිමිකම් කියා සිටිය හැකි විත්තිවාචක සහ වගකීමේ සීමාවන් ද ඉල්ලා සිටීමට ඒ සේවකයාට හෝ අනුයෝජිතයාට හිමිකම ඇත්තේ ය.

3. ප්‍රවාහකගෙන් සහ ඒ සේවකයාගෙන් හා අනුයෝජිතයාගෙන් අයකර ගනු ලැබිය හැකි මුදල් ප්‍රමාණවල එකතුව කිසිදු විටක මේ රීතිවල විධිවිධාන සලසා ඇති සීමාව නොඉක්ම විය යුතු ය.

4. එසේ වුව ද හානි කිරීමේ චේතනාව ඇතිව හෝ නොසැලකිල්ලෙන් හා හානියක් සිදුවීමට ඉඩ ඇතැයි යන දැනීම ඇතිව සේවකයාගේ නැතහොත් අනුයෝජිතයාගේ ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් හානිය සිදු වූ බව ඔප්පු කරනු ලැබුවහොත්, මේ ව්‍යවස්ථාවේ විධිවිධාන තමා කෙරෙහි අදාළ කර ගැනීමේ හිමිකම ප්‍රවාහකගේ සේවකයාට හෝ අනුයෝජිතයාට නොතිබිය යුතු ය.

## V වන ව්‍යවස්ථාව

මේ රීති යටතේ තම අයිතිවාසිකම් සහ පරිහාර සියල්ල හෝ ඉන් කොටසක් අත්හැරීම හෝ තම වගකීම් සහ බැඳීම් කිසිවක් වැඩි කර ගැනීම නැව්ගත කරන්නා වෙත නිකුත් කරන්නා වූ නෞභාර පත්‍රයෙහි අන්තර්ගත කරනු ලැබුවහොත්, ප්‍රවාහකට එසේ අත්හැරීමේ හෝ වැඩිකර ගැනීමේ හෝ නිදහස ඇත්තේ ය.

මේ රීතිවල විධිවිධාන නෞභාටක පත්‍රවලට අදාළ නොවිය යුතු නමුත්, නෞභාටක පත්‍රයක් යටතේ වූ නැවක් සම්බන්ධයෙන් නෞභාර පත්‍ර නිකුත් කරනු ලැබ ඇත් නම්, මේ රීතිවල නියමයන් අනුව ඔවුන් ක්‍රියා කළ යුතු ය. පොදු වන්දියක් පිළිබඳ කිසියම් නීත්‍යනුකූල විධිවිධානයක් නෞභාර පත්‍රයෙහි ඇතුළත් කිරීම, මේ රීතිවල සඳහන් කිසිවකින් වළක්වනු නොලැබිය යුතු ය.

## VI වන ව්‍යවස්ථාව

ඉහතින් වූ ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, යම් විශේෂ බඩු සම්බන්ධයෙන් ප්‍රවාහකයකුට හෝ ප්‍රවාහකගේ නෞකාධිපතියකුට හෝ අනුයෝජිතයකුට නැව්ගත කරන්නකු සමග, ඒ බඩු සඳහා ප්‍රවාහකගේ වගකීම් සහ බැඳීම් සම්බන්ධයෙන් ද, ඒ බඩු සම්බන්ධයෙන් ප්‍රවාහකගේ අයිතිවාසිකම් සහ පරිහාර සම්බන්ධයෙන් හෝ මේ නියමය රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි නොවන තාක් සමුද්‍ර තරණය සඳහා යෝග්‍ය කිරීම සම්බන්ධයෙන් ස්වකීය බැඳීම සම්බන්ධයෙන් හෝ මුහුදෙන් ගෙන යනු ලබන බඩු පැටවීම, හැසිරවීම, ගබඩා කිරීම, ගෙන යාම, භාරයේ තබා ගැනීම, ආරක්ෂාව සහ බෑම සම්බන්ධයෙන් තම සේවකයන්ගේ හෝ අනුයෝජිතයන්ගේ ආරක්ෂාව හෝ උනන්දුව සම්බන්ධයෙන් ද යම් නියම සහිත යම් එකඟවීමකට එළඹීමේ නිදහස ඇත්තේ ය. එසේ වුවද මෙම අවස්ථාවේ දී නෞභාර පත්‍රයක් නිකුත් කර නොතිබිය යුතු අතර, නිකුත් කරනු නොලැබිය යුතු ය; තව ද, එකඟ වූ නියමයන් ගණුදෙනු කළ නොහැකි ලේඛනයක් විය යුතු අය පතක ඇතුළත් කරනු ලැබ, එසේ සළකුණු කොට තිබිය යුතු ය. එසේ ඇතුළත් වූ යම් එකඟවීමකට පූර්ණ නෛතික බලය තිබිය යුතු ය:

එසේ වුව ද මේ ව්‍යවස්ථාව සාමාන්‍ය වෙළෙඳ කටයුතුවල දී කරනු ලබන සාමාන්‍ය වෙළෙඳ නැව්ගත කිරීම්වලට නොව ගෙන යනු ලැබිය යුතු දේපළවල ස්වභාවය හෝ තත්ත්වය හෝ ගෙන යෑම ඉටු කළ යුතු අවස්ථා, නියම සහ කොන්දේසි විශේෂ එකඟවීමක් මගින් සාධාරණ බවට පත් කරනු ලබන වෙනත් නැව්ගත කිරීම සඳහා පමණක් අදාළ විය යුතු ය.

## VII වන ව්‍යවස්ථාව

මුහුදෙන් බඩු ප්‍රවාහනය කෙරෙන නැවට බඩු පැටවීමට පෙර සහ එයින් බඩු බෑමෙන් පසුව බඩු භාරයේ තබා ගැනීම, ආරක්ෂා කිරීම සහ හැසිරවීම පිළිබඳව හෝ ඒ සම්බන්ධයෙන් බඩුවලට සිදුවන අලාභ හෝ හානි සඳහා ප්‍රවාහකගේ හෝ නැවෙහි වගකීම සහ බැඳීම සම්බන්ධයෙන් යම් එකඟවීමකට, නියමයකට, කොන්දේසියකට, ශේෂ කිරීමකට හෝ නිදහස් කිරීමකට ඇතුළත් වීමෙන් ප්‍රවාහකයකු හෝ නැව්ගත කරන්නකු මෙහි අඩංගු කිසිවකින් වළක්වනු නොලැබේ.

## VIII වන ව්‍යවස්ථාව

මුහුදු යන යාත්‍රාවල අයිතිකරුවන්ගේ බැඳීම් සීමා කිරීමට අදාළව තත් කාලයෙහි බලාත්මකව පවත්නා යම් ව්‍යවස්ථාවක් යටතේ ප්‍රවාහකයගේ අයිතිවාසිකම් සහ වගකීම් කෙරෙහි මේ රීතිවල විධිවිධාන බල නොපැවැත්විය යුතු ය.

## IX වන ව්‍යවස්ථාව

න්‍යෂ්ටික හානි සඳහා බැඳීම් පාලනය කරන යම් ජාත්‍යන්තර සම්මුතියක හෝ ජාතික නීතියක විධිවිධාන කෙරෙහි, මේ රීති බල නොපැවැත්විය යුතු ය.

## X වන ව්‍යවස්ථාව

නැවෙහි, ප්‍රවාහකයගේ, නැව් ගතකරන්නාගේ, ප්‍රතිලාභියාගේ හෝ වෙනත් යම් සම්බන්ධ තැනැත්තකුගේ ජාතිය කුමක් වුව ද, මේ රීතිවල විධිවිධාන—

(අ) තොගභාර පත්‍රය, ගිවිසුමට එළඹෙන රාජ්‍යයක දී, නිකුත් කරනු ලබන්නේ නම්; හෝ

(ආ) ප්‍රවාහනය කිරීම, ගිවිසුමට එළඹෙන රාජ්‍යයක වරායක සිට ආරම්භ වන්නේ නම්; හෝ

(ඇ) මේ රීති හෝ ඒවා බලාත්මක කරන යම් රාජ්‍යයක ව්‍යවස්ථා මගින් ගිවිසුම පාලනය විය යුතු යයි තොගභාර පත්‍රයෙහි ඇතුළත් ගිවිසුමෙන් හෝ තොගභාර පත්‍රයෙන් ඔප්පුවන ගිවිසුමෙන් විධිවිධාන සලස්වා ඇත්නම්

වෙනත් රාජ්‍යයන් දෙකක වරායවල් අතර බඩු ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වූ නෑම තොගභාර පත්‍රයකට ම අදාළ විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල / (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.